චක්‍රලේඛ අංක ....24..../2013

මගේ අංක ධබ්/01/සු.සා.රා/2013
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.05.17

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

## සුභසාධක නිළධාරීන්ගේ රාජකාරි

බන්ධනාගාර රැඳවියන් යහපත් පුරවැසියන් ලෙස නැවත සමාජ ගත කිරීම උදෙසා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර ඇති පුනරුත්ථාපන ක්‍රියාවලිය තුල මූලික කාර්යභාරය ඉටුකරනු ලබන්නේ සුභසාධක නිලධාරීන් විසිනි.

දැනට දිවයිනේ සියළුම බන්ධනාගාර සඳහා සුභසාධක නිලධාරීන් අනුයුක්ත කොට ඇත. මෙකී නිළධාරීන් තම රාජකාරිය ඉටුකරනු ලබන්නේ මූලික වශයෙන් එකී බන්ධනාගාරයේ අධිකාරීගේ උපදෙස් සහ මගපෙන්වීම යටතේ වන අතර රාජකාරි මැනවින් ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සලසාලීමට අධිකාරීවරයා ක්‍රියා කල යුතුය. රැඳවියන්ගේ සුභසාධනය සහ පුනරුත්ථාපනය ප්‍රතිඵලදායි වැඩපිළිවෙලක් බවට පත්වීමට නම් සුභසාධක නිළධාරීන් ආයතනයේ අනිකුත් සියළුම නිළධාරීන්ගේ සහයෝගය මෙම වැඩසටහන් සඳහා ලබාගැනීමට උනන්දු විය යුතුය. එසේම අනිකුත් නිලධාරීන්ද සුභසාධක නිලධාරීන් විසින් රැඳවි පුනරුත්ථාපනය කටයුතු සඳහා සිදුකරන කාර්යභාරයන්ට සම්පූර්ණ සහයෝගය ලබාදීමටද වගබලා ගත යුතුය. එසේම සුභසාධක නිළධාරීන්ගේ රාජකාරි 1 පෙළ සුභසාධක නිළධාරීන් මෙන්ම එකී අංශයේ අනිකුත් මාණ්ඩලික නිළධාරීන් විසින්ද අධීක්ෂණ කලයුතු අතර අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම් කලයුතුය.

සුභසාධක නිළධාරීන්ගේ රාජකාරි ලැයිස්තුව

01. සුභසාධක නිළධාරීන් දෛනිකව සියළුම නවක සිරකරුවන් හා සැකකරුවන් සඳහා ආරම්භක පංති පැවැත්වීම. ඒ සඳහා ලේඛන පවත්වාගෙන යාම සහ දෛනිකව එම ලේඛන අධිකාරීගේ දැනගැනීමට සහ ක්‍රියාකිරීම සඳහා ඉදිරිපත් කිරීම.

02. සිරකරුවන්ගේ හා සැකකරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහල නැංවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය මත වෘද්ධ අධ්‍යාපන පංති ක්‍රියාත්මක කිරීම.

03. සිරකරුවන්ගේ හා සැකකරුවන්ගේ අවශ්‍යතාවය අනුව විධිමත් අධ්‍යාපන පහසුකම්ද සැපයීමට කටයුතු කලයුතු අතර ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම් වලට අනුව රජය විසින් පවත්වන විභාග සඳහා ඔවුන්ට පෙනිසිටීමට අවකාශ සැලසීම.

04. සිරකරුවන්ගේත් සැකකරුවන්ගෙත් ආගමික සුභසිද්ධිය සඳහා සර්ව ආගමික පූජකවරුන් වාර්ෂිකව පත්කර ගැනීමට සුභසාධක නිලධාරීන් කටයුතු කල යුතු අතර සිරකරුවන්ට සහ සැකකරුවන්ට ආගමික වතාවත් වල නියැලීමට අවස්ථාවන් සලසා දියයුතු අතර සර්ව ආගමික දහම් පාසල් නේවාසිකයින් සඳහා පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

05. සිරකරුවන්ගේත් සැකකරුවන්ගේත් අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.

06. සිරකරුවන්ගේත් සැකකරුවන්ගේත් ශාරීරික සංවර්ධනය උදෙසා ඔවුනට ක්‍රීඩාවන්හි නියැලීමට අවශ්‍ය පහසුකම් සලසාලීමට මැදිහත් වියයුතු අතර ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය නැංවීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

07. සිරකරුවන්ගේත් සැකකරුවන්ගේත් සමාජීය දැනුම සහ අවබෝධය වර්ධනය කරලීම සඳහා පුස්තකාල පහසුකම් මෙන්ම සන්නිවේදන පහසුකම් සැලසීමට කටයුතු කිරීම.

08. සිරකරුවන් සඳහා උපදේශන පහසුකම් සැලසීමට කටයුතු කිරීම.

09. සිරකරුවන්ගේ වෘත්තිය පුහුණුව නංවාලීමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.

10. සිරකරුවන්ගේත් සැකකරුවන්ගේත් නීතිමය ගැටළු විසදාලීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ඇතුළු වෙනත් සමාජ සංවිධාන සමඟ එක්ව ක්‍රියා කිරීම.

11. සිරකරුවන් සඳහා පවුල් සුභසාධනය සහිත පසුහාරකාරීත්ව ව්‍යාපෘති ක්‍රියාවෙහි යෙදවීමට ක්‍රියා කිරීම.

12. අපරාධ වැලැක්වීමේ ආඥා පනතේ 11 වන වගන්තිය පරිදි සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.

ඒ යටතේ,

I. බලපත්‍ර මත සුදුසුකම් ලබන සියළුම සිරකරුවන්ගේ ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණ වාර්තා සැකසීම.

II. සිරකරුවන්ගේ ක්ෂේත්‍ර විමර්ශන වාර්තා සැකසීම.

මෙම කාර්යයේදී ඉතාමත් සුපරීක්ෂාකාරී විය යුතු අතර ක්ෂේත්‍ර විමර්ශනය කිරීමේදී සුභසාධක නිලධාරීන් සිරකරුවන්ගේ නිවසට මෙන්ම ග්‍රාම නිලධාරී හමුවීමට සෑම විටම උත්සාහ ගත යුතුය. ඊට අමතරව ප්‍රදේශයේ ප්‍රභූවරුන්ගෙන් මෙන්ම තොරතුරු මූලාශ්‍ර වලින්ද නිවැරදි තොරතුරු ලබාගෙන ප්‍රතිඵලදායී ක්ෂේත්‍ර විමර්ශන වාර්තා සැකසීම.

III. බලපත්‍රමත මුදාහැරීම සලකා බැලීමට සුදුසුකම් ලබන දිනය වන විට සුදුසුකම්ලත් සියළුම සිරකරුවන්ගේ සමාජ වාර්තා ගොනු බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

IV. බලපත්‍ර මත මුදාහරින සිරකරුවන්ගේ පරිපාලනය සුභසාධක නිළධාරීන් විසින් ඉටු කල යුතු අතර, අධීක්ෂණ කටයුතු ඊට ඉහළ ශ්‍රේණියේ නිළධාරීන් විසින් සිදුකරනු ඇත.

V. ඉහත කී පනතේ නියෝග පරිදි බලපත්‍රය අවලංගු කල අවස්ථාවන් හිදී ක්‍රියා කිරීම.

VI. බලපත්‍ර ක්‍රමයට සුදුසුකම් ලබන සිරකරුවන් නියමිත පරිදි නිවාස නිවාඩු යැවීමට ක්‍රියා කිරීම.

VII. බලපත්‍රධාරීන් පරිපාලනය

13. වැඩ සහන ක්‍රමයට අනුව බාහිර රාජ්‍ය ආයතන වල නිශ්චිත වැටුපක් යටතේ සේවයට යෙදවිය හැකි සිරකරුවන් එම කාර්යයේ යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉටු කිරීම.

14. සිරකරුවන් හා සැකකරුවන් තුල යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සෞඛ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.

15. සිරකරුවන් හා සැකකරුවන් ඉදිරිපත් කරන ගැටළු සහ දුක්ගැනවිලි විසඳාලීමට අවශ්‍ය කටයුතු කිරීම.

16. සිරකරුවන් තුල කලා කුසලතා නැංවීම සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

17. සිරකරුවන්ගේ විවේක කාලය ඵලදායි ලෙස ගතකිරීම සඳහා විනෝද භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පංති සංවිධානය කිරීම.

18. මත්ද්‍රව්‍ය වැරදිකරුවන් සඳහා විශේෂ වූ වැඩසටහන් ඒ හා සම්බන්ධ ආයතන සම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක කිරීම.

19. සිරකරු සුභසාධක අරමුදල පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා කාර්යක්ෂමව යොදා ගැනීමට ක්‍රියාකිරීම.

20. සිරකරුවන්ගේත් සැකකරුවන්ගේත් වාට්ටු සංචාරය මෙන්ම සිරකරුවන්ගේ වැඩඅංශ සංචාරය කිරීම සඳහා අඛණ්ඩ වැඩපිළිවෙලක් යොදා ගත යුතු අතර ඒ සඳහා ලේඛණයක් පවත්වා ගත යුතුය. ඒම ලේඛණය බන්ධනාගාර අධිකාරී වෙත ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම.

21. සිරකරුවන් සඳහා යෞවන සමාජ පිහිටුවීම සහ බාලදක්ෂ කටයුතු ක්‍රියාත්මක කිරීම.

22. සිරකරුවන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය සංවර්ධනය සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.

23. ශ්‍රී ලංකා සිරකරු සුභසාධක සංගමයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.

24. තමන්ට පැවරෙන ක්ෂේත්‍ර රාජකාරී මැනවින් ඉටුකිරීම.

25. සිරකරුවන් සඳහා නිදහස් වීමට පෙර සූදානම් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

26. සේවාවට අදාලව පැවරෙන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

27. සුභසාධක නිලධාරීන් විසින් පවත්වාගෙන යා යුතු මූලික ලේඛන

    1. ආරම්භක හැඳින්වීමේ ලේඛනය.
    2. ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණ වාර්තා ලේඛනය.
    3. ක්ෂේත්‍ර විමර්ශන වාර්තා ලේඛනය.
    4. බලපත්‍රධාරී නාම ලේඛනය.
    5. බලපත්‍රධාරී වාර්තා කිරීමේ ලේඛනය.
    6. යැපෙන්නන් සඳහා ආධාර ලේඛනය.
    7. වාට්ටු/වැඩ අංශ සංචාරය කිරීමේ ලේඛනය.
    8. සති අන්ත රාජකාරී ලේඛනය.
    9. ක්ෂේත්‍ර රාජකාරී ලේඛනය.
    10. පුස්තකාල පොත් ලේඛනය.
    11. පරිත්‍යාග ලේඛනය.
    12. සිර/සැක ඉල්ලීම් ලේඛනය.
    13. එන/යන ලිපි ලේඛනය.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.